# ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස(වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන) ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අළුත්වැඩියාව හා අවශ්‍ය උපකරණ ලබාදීම - 2026

## 1. හැඳින්වීම.

ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩිහිටි නිවාස 456 ක් පමණ මේ වන විට හඳුනාගෙන ඇති අතර, එම වැඩිහිටි නිවාසවල නේවාසික වැඩිහිටි මව්පියවරුන් 11,000 කට වඩා වැඩි පිරිසක් විවිධ රෝගී තත්ත්වයන්ට, මානසික තත්ත්වයන්ට මුහුණ දෙමින් තම සැඳෑ සමය ගත කරති. නමුත් එම වැඩිහිටි නිවාස විධිමත් හා පොදු ප්‍රමිතියක් යටතේ පවත්වාගෙන යන බවක් දක්නට නොලැබේ. දිනෙන් දින වේගයෙන් ඉහළ යමින් පවතින වැඩිහිටි ප්‍රජාව රටට විශාල අභියෝගයක් වෙමින්, වැඩිහිටි නිවාස සඳහා ද ඇති ඉල්ලුම ඉහළ ගොස් ඇත. නේවාසික වැඩිහිටියන්ගේ වර්තමානය හා අනාගතය වෙනුවෙන් පැය 24 පුරා සෞඛ්‍යාරක්ෂිත, ආරක්ෂිත රැකවරණයන්ගෙන් සමන්විත වැඩිහිටි නිවාස විධිමත් හා පොදු ප්‍රමිතියක් යටතේ පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා වැඩිහිටි නිවාස සුරක්ෂිත, ගුණාත්මක සහ ඵලදායි සේවාවක් වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට අනුකූලව (1506:2015) වැඩිහිටි නිවාසයන්හි පවතින අඩුපාඩු අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් භාණ්ඩාගාර අරමුදල මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා 2026 වර්ෂයේ වැඩිහිටි නිවාස 20 ක් වෙනුවෙන් එක් නිවාසයකට රුපියල් මිලියන 02 ක උපරිමයකට යටත්ව අවශ්‍ය මුදල් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.(කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිහිටි නිවාස සඳහා ප්‍රමුඛතාවය ලබා දේ)

## 2. ව්‍යාපෘති අරමුණු

1. වැඩිහිටි නිවාසගත නේවාසිකයන්ට තම සැඳෑසමය ආරක්ෂිතව හා සතුටින් ගත කිරීමට සුදුසු වැඩිහිටි නිවාස ඇති කිරීම.
2. නිවාසගත වැඩිහිටි මව්පියවරුන්ට පියවරුන්ට වඩා හොඳ පහසුකම් සලසා දීම.
3. ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන සියළුම වැඩිහිටි නිවාස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට අනුකූලව (1506:2015) පවත්වාගෙන යාම සඳහා කටයුතු සලසා දීම.

## 3.ක්‍රියාත්මක ක්‍රමවේදය

1. පවත්වාගෙන යනු ලබන සෑම වැඩිහිටි නිවාසයක්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර තිබිය යුතුයි. (එසේ නොමැති නම් මෙම අයදුම්පත සමඟ ලියාපදිංචිය සඳහා අවශ්‍ය සියළු ලේඛන ඉදිරිපත් කළ හැක).
2. වැඩිහිටි නිවාසය ආරම්භකර වසරකට වඩා වැඩි කාලයක් පවත්වාගෙන යනු ලබන එකක් විය යුතුයි.
3. නොමිලයේ වැඩිහිටියන් වෙනුවෙන් පහසුකම් සපයනු ලබන වැඩිහිටි නිවාසයක් විය යුතුයි.
4. වැඩිහිටියන් 05 ක් හෝ ඊට වඩා මේ වන විට සේවය සපයන වැඩිහිටි නිවාස විය යුතුයි.
5. ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිහිටි වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම පර්චස් 40ක් හෝ ඊට වඩා විශාල විය යුතු අතර, නගර සභා හෝ මහා නගර සභා සීමාව තුළ පර්චස් 40ට අඩු ඉඩමක වුවද මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සපුරා තිබේ නම් ඒ පිළිබඳ සලකා බලනු ලැබේ.

6. වැඩිහිටි නිවාසය අයත් සංවිධානය, ආයතනය, පාලක සභාව හෝ පුද්ගලයා/පුද්ගලයින් විසින් වැඩිහිටි නිවාසයේ සිදු කිරීමට අදාල සංවර්ධන කටයුතු වෙනුවෙන් වන 'දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා **අවබෝධතා ගිවිසුමකට**' ප්‍රාදේශීය ලේකම් සමඟ ගිවිසුම් ගත විය යුතුය.
7. වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය, ආයතනය හෝ පුද්ගලයා/පුද්ගලයින් මේ සමඟ අමුණා ඇති 'දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා **එකඟතා ගිවිසුම**' නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කල යුතුය.
8. අවශ්‍ය ඕනෑම අවස්ථාවක වැඩිහිටි විෂයට අදාල රාජකාරී කටයුතු වල නිරත වී ඇති නිලධාරීන් හට අධීක්ෂණ හා පරීක්ෂණ කටයුතු වෙනුවෙන් මැදිහත් වීමට අවස්ථාව සැලසිය යුතුයි.
9. අත්‍යාවශ්‍ය අවස්ථාවක දී ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල මඟින් වැඩිහිටි නිවාසයට වැඩිහිටියකු ඇතුලත් කිරීම සඳහා ඉල්ලීම් කල විට, ඒ සඳහා අවම වශයෙන් නේවාසික වැඩිහිටියන්ගෙන් 20%ක ප්‍රමාණයක් නිවාසගත කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කැමැත්ත පලකරන (2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ දෙවන කොටසේ 15 (3) වගන්තිය ප්‍රකාරව) වැඩිහිටි නිවාසයක් විය යුතුයි.
10. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිකුත් කර ඇති වැඩිහිටි උවටැන් නිවාස සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතියට (1506:2015) අනුකූලව අළුත්වැඩියාවන් සිදු කිරීම හා උපකරණ මිලදී ගැනීම් සිදු කල යුතුය.
11. ඉඩම හෝ ගොඩනැගිලි කුලී පදනම මත හෝ බදු පදනම මත ලබාගෙන පවත්වාගෙන යනු ලබන්නේ නම් දීර්ඝ කාලීන කුලී හෝ බදු ගිවිසුම් සහිත වැඩිහිටි නිවාස සඳහා ප්‍රතිපාදන ලබාදීම සලකා බැලිය හැක.

**4.<u>ඉදිරිපත් කළ යුතු ලේඛන</u>**

1. ඇමුණුම 02 සඳහන් ඉල්ලුම් පත්‍රයට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්හි සිදු කල යුතු අලුත්වැඩියා කටයුතු සහ උපකරණ ලබා දීම පිළිබඳ තොරතුරු එක්රැස් කර ගත යුතුවේ.(වැඩිහිටි නිවාසය මඟින් ඉල්ලීම් ලිපියක් ලබා ගත යුතුය.මිලියන 02 ට වඩා වැඩි මුදලක් අදාළ ව්‍යාපෘතිය සඳහා වැය වන්නේනම් එම මුදල ලබා ගන්නා ආකාරය පිළිබඳ ලිඛිතව දන්වා එවිය යුතුය.)
2. එක්රැස් කරගත් තොරතුරු සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර වලට අනුව ප්‍රතිලාභීන් තෝරාගැනීමේ කොන්දේසි සහ ප්‍රමුඛතා වලට අනුකූලව වැඩිහිටි නිවාස තෝරා ගැනීම.
3. තෝරාගන්නා ලද වැඩිහිටි නිවාසයන්හි සිදු කල යුතු අළුත්වැඩියා කටයුතු සහ උපකරණ ලබාදීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිකුත් කර ඇති වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට(1506-2015) අනුකූලව ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව ඉදිරිපත්කල යුතුය. (විධිමත් පරිදි සකස් කල ඇස්තමේන්තුව ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.)
4. ඉහත වැඩසටහන යටතේ ආධාර මුදල් ලබා දෙන සෑම වැඩිහිටි නිවාසක් සමඟ ගිවිසුම්ගත විය යුතු "දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුම" (ඇමුණුම 04) හා වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය, ආයතනය හෝ

පුද්ගලයා/පුද්ගලයින් මේ සමඟ අමුණා ඇති “දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකගතා ගිවිසුම” (ඇමුණුම 03) නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කල යුතුය. ( මෙම ගිවිසුම් වල එක් මුල් පිටපතක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමුකල යුතු අතර අනෙක් මුල් පිටපත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ගත යුතුවේ).

5. නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කල යුතුය.( මෙම ගිවිසුමේ එක් මුල් පිටපතක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමුකල යුතු අතර අනෙක් මුල් පිටපත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ගත යුතුවේ).

6. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී සහතික කරනු ලැබූ ඉල්ලුම් පත්‍රය සහ ඇස්තමේන්තුව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය.

7. සුදුසුකම්ලත් වැඩිහිටි නිවාස වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් පහත පියවරයන් යටතේ චෙක්පත් මඟින් බැර කිරීමට කටයුතු කරනු ඇත.
   I. **අත්තිකාරම් ගෙවීම** - 20% (විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, ගිවිසුම් පිටපත් හා ඇස්තමේතුව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)
   II. **බිල්පත් ගෙවීම** - 60% (සහතික කල බිල් පිටපත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)
   III. **අවසන් ගෙවීම** - 20% (වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)

8. වැඩිහිටි විෂය භාර නිලධාරි විසින් ව්‍යාපෘතියට අදාලව මාසික භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව මාසිකව මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය. (ඇමුණුම 05)

9. අලුත්වැඩියාවන් සඳහා භාණ්ඩ/ උපකරණ ලබා දෙනු ලබන අවස්ථාවකදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් භාණ්ඩ මිලදී ගැනීම සිදු කර වැඩිහිටි නිවාසයට සපයා දීම සිදුකල යුතුවේ.

10. මෙම වැඩසටහන සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

11. එක් වැඩිහිටි නිවාසයකට මිලියන 02 බැගින් වැඩිහිටි නිවාස 20 ක් සඳහා ආධාර ලබා දීම මෙහිදී සිදු කරනු ලබයි.

12. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් /දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ලැබෙන ඉල්ලීම් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත 2026 මාර්තු මස 30 දිනට පෙර යොමු කළ යුතු වේ.

**05 .<u>අධීක්ෂණය හා පසු විපරම් කටයුතු</u>**

01.ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාල අරමුදල් ලැබීමෙන් අනතුරුව මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (පොදු 172 ) මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය.

02.විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු මඟින් අදාල කාර්යය 2026.11.30 වන දිනට පෙර අවසන් කල යුතුවේ.

03.මෙම ව්‍යාපෘති 2027 වර්ෂය සඳහා අවිච්ඡේද නොවන බැවින් 2027 වර්ෂය තුළ වැඩ අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් මේ සඳහා යොමු කළ යුතුය.

**06.<u>පිරික්සුම් ලැයිස්තුව</u>**

I. නිවාස තෝරා ගැනීමේ නිර්ණායක (ඇමුණුම 01)
II. අයදුම්පත්‍රය (ඇමුණුම 02)
III. දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකඟතා ගිවිසුම (ඇමුණුම 03)
IV. දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුම (ඇමුණුම 04)
V. මාසික භෞතික හා මුල්‍ය ප්‍රගති වාර්තාව (ඇමුණුම 05)